(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(12).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 ඔක්තෝබර් 22 සිකුරාදා**

**2021 නොවැම්බර් 08 සඳුදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඍඅ) සහ (ඍආ) වගන්තිය යටතේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූනි 03 දිනැති අංක 2126/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ද) වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 12 දිනැති අංක 2218/64 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු, 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 2247/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මැයි 03 දිනැති අංක 2226/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2021 නොවැම්බර් 10 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

37/2020

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාව වෙත ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා වර්තමානයේදී අවශ්‍ය වන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2019.01.01 දිනට රාජ්‍ය සේවය තුළ සේවයේ යෙදී සිටි වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉදිරි වර්ෂවලදී රාජ්‍ය සේවයට බඳවා ගැනිමට යෝජිත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව බිහිකර ගැනීම සඳහා රජය සැලසුම් සකස් කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

275/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ මිදි නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මිදි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති මිදි ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) මිදි වගාව සඳහා සුදුසු දේශගුණික තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 හා 2019 වර්ෂවලදී ශ්‍රී ලංකාවට මිදි ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව මිදි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී මිදි අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

446/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එන්ජින් අතරින් මේ වනවිට ධාවනයට යොදවා ඇති දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ධාවනයට යොදවා නොමැති දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දුම්රිය එන්ජින් ධාවනයට යොදවා නොගැනීමට හේතු කවරේද;

(v) එම දුම්රිය එන්ජින් කඩිනමින් ධාවනයට යොදවා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

724/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව, මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඖෂධ වෙළඳසැල් (ඔසුසල්) පිහිටා නොමැති බවත්;

(ii) ඉහත දිස්ත්‍රික්කවල ජීවත්වන සාමාන්‍ය ජනතාව ඇතැම් ඖෂධ ලබා ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කවල මේ වනතෙක් රජයේ ඔසුසල් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) එම දිස්ත්‍රික්කවල රජයේ ඔසුසල් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

820/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) එම බන්ධනාගාරවල රඳවා තැබිය හැකි රැඳවියන් සංඛ්‍යාව හා මේ වනවිට රඳවා තබා ඇති රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ධාරිතාවය ඉක්මවා රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(v) රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

849/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කඳුරුවෙල විකල්ප මාර්ගයේ කි.මී. 0 + 000 සිට කි.මී. 2 + 687 දක්වා වූ මාර්ග කොටස, මංතීරු 4ක මාර්ගයක් ලෙස පුළුල් කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට, රජයේ බීජ වී ගොවිපොළට අයත්වන සහ ප්‍රදේශවාසීන් විසින් භුක්ති විඳින ලද ගොඩ ඉඩම්, මඩ ඉඩම්, මුඩු ඉඩම්, ගෙවතු ඉඩම් සහ ස්ථිර ගොඩනැගිලි සහිත ඉඩම් රජයට පවරාගෙන තිබේද;

(ii) එසේ නම්, එලෙස පවරාගෙන ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) පවරාගත් ඉඩම්වල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වන්දි මුදලක් ගෙවා තිබේද;

(v) එසේ නම්, ගෙවනු ලැබූ වන්දි මුදල එක් එක් ඉඩම් හිමිකරු අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් මාර්ග කොටස පුළුල් කිරීම යටතේ මේ වනවිට වැඩ නිම කර ඇති දුර ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

997/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන විද්‍යාපීඨවල පුහුණු පාඨමාලාවන් මෑතකදී හදාරා අවසන්කර ඇති ඩිප්ලෝමාධාරීන් සඳහා මේ වනතෙක් ගුරු පත්වීම් ලබා දී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් මෑතක සිට ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගුරු හිඟයට පිළියමක් ලෙසද, දරුවන්ගේ අධ්‍යාපනය ඉහල නැංවීම සඳහා ද විද්‍යා පීඨවල පුහුණු පාඨමාලාවන් හදාරා අවසන් කර ඇති මෙම ඩිප්ලෝමාධාරීන් සඳහා ගුරු පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1063/2020

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සැරිසරන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වන අලින් පළවා හැරීමට සිටින නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) එම වන අලින් පළවා හැරීමට අදාළ නිලධාරින්ගේ භිහය මගහරවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2021 නොවැම්බර් 10 බදාදා)**

1906/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට වනාන්තර ඉඩම් පවරා තිබේද;

(ii) නොඑසේ නම්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වනාන්තර ඉඩම් ලබා දෙන ලෙස එම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහඔය-ගල්වලයාය වනාන්තරය, රජයේ රක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් කිරීමට යෝජනා කර තිබියදී, එයට අයත් විශාල වනාන්තර කොටසක් එළිපෙහෙළි කිරීම සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම්, ඊට හේතුව කවරේද;

(iii) ඉහත ගල්වලයාය වනාන්තරයට හානි සිදු කරන ලද පුද්ගලයන්ට එරෙහිව නීතිමය කටයුතු සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, නීතිමය කටයුතු සිදු කරන ලද දින වකවානු සහ ඔවුන්ට අධිකරණය විසින් පැනවූ දඬුවම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මේ වනවිට, මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර යොදා මහඔය, පොල්ලේබැද්ද, ගල්වලයාය සහ වරාපිටිය යන වනාන්තර එළිපෙහෙළි කිරීම, වන විනාශයක් ලෙස පිළිගන්නේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1977/2021

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපලවල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2021/2021

ගරු මධුර විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපලවල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2026/2021

ගරු මධුර විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපලවල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?